# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 57 දරන විශ්වවිද්‍යාල
# (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 07 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 09 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 2.50 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

# 2009 අංක 57 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 07 වන දින]

එල්.ඩී.—ඕ. 49/2007.

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 57 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48 වන වගන්තියේ (1අ) උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද ඉවත් කොට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1978 අංක 16 දරන පනතේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) පීඨය සංයුක්ත වන අධ්‍යයන අංශවලට අයත් වූ සියලු ස්ථිර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු, ආශ්‍රිත මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ කථිකාචාර්යවරු ;

(ඇ) කථිකාචාර්යවරු අතරින් අධ්‍යයන අංශයේ (ආධුනික) කථිකාචාර්යවරුන් විසින් තෝරාගනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් හැර පීඨයට සම්බන්ධ වී ඇති සහ ඉගැන්වීමේ කාර්යයෙහි යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනකු ; ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ii) කලින් කල සාදනු ලබන රීතිවලට අනුව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු වැටුප් සංකේතයක් හෝ වැටුප් තලයක් අයත් වන්නා වූ ආචාර්යවරයකුගේ තනතුර හැර වෙනත් තනතුරකට බඳවා ගැනීම:

2-PL 004220 —3,490 (2009/07)

එසේ වුවද, කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස අදාළ උසස් අධ්‍යාපන ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින් එකී නිර්දේශ ලැබීමෙන් පසු අවශ්‍ය බඳවා ගැනීම් කරනු ලැබිය යුතු ය; සහ ”

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“එසේ වුව ද, පත්වීම —

(අ) ආචාර්ය තනතුරක් වන අවස්ථාවක සහ ඒ පත්වීම්ලාභියා අනුයුක්ත කරනු ලැබ ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක වෙනත් අධ්‍යයන අංශයක එකී පත්වීම්ලාභියා ආචාර්යවරයකු ලෙස කලින් ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක දී ඒ පත් කිරීම, ප්‍රථම අවස්ථාවේ දී එක් වර්ෂයක ආධුනික කාලයකට පමණක් විය යුතු ය ; හෝ

(ආ) ආචාර්යවරයකු වන අවස්ථාවක සහ ඒ පත්වීම්ලාභියා අනුයුක්ත කරනු ලැබ ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක වෙනත් අධ්‍යයන අංශයක ආචාර්යවරයකුට සමාන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ පත් කිරීම, ප්‍රථම අවස්ථාවේ දී, එක් වර්ෂයක ආධුනික කාලයකට පමණක් විය යුතු ය ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. “ආචාර්යවරයකුගේ තනතුරක් දරන්නකු හැර” යන වචනවල සිට “සලකනු ලැබිය යුතු ය” යන වචන දක්වා වූ වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“ආචාර්යවරයකුගේ තනතුරක් හැර වෙනත් තනතුරක් දරන්නකු විසින් තමාගේ විශ්‍රාම ගන්නා වෛකල්පිත වයසින් පසුව එනම්, උදාහරණයක් වශයෙන් විශ්‍රාමික වයස වන වයස අවුරුදු පනස් පහේ සිට වයස අවුරුදු පනස් හත දක්වා සේවයේ නියුක්තව සිටිය යුතු අතර, ඉන්පසු සේවයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.”.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ "ආචාර්යවරයා" යන අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ආචාර්යවරයා" යන්නෙන්, යම් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු, 1 වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු, 2 වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු, කථිකාචාර්යවරයකු සහ (ආධුනික) කථිකාචාර්යවරයකු, මෙන්ම ආචාර්යවරයකු වන්නා වූ තනතුරක් ලෙස ආඥාපනත මගින් ප්‍රකාශ කරනු ලැබ ඇති යම් තනතුරක් දරන්නකු අදහස් වේ ; සහ"

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

ල

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.